# මාලඹේ වෛද්‍ය විද්‍යාල සිසුන්ගේ සායනික පුහුණුවට විරුද්ධ නම් නඩු

## දෙමාපිය සංගමයේ සභාපති ගැමුණු රත්නායක

ශ්‍රියානි විජේසිංහ

**මාලඹේ** පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ අධ්‍යාපනය ලබන සිසුන්ට සායනික පුහුණුව ලබා දීමට අධිකරණය මගින් අවසර ලබා දී තිබියදීත් කිසියම් පාර්ශ්වයක් එයට විරෝධය පළ කරන්නේ නම් ඊට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කරන බව මාලඹේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ දෙමව්පිය සංගමයේ සභාපති ගැමුණු රත්නායක මහතා සඳහන් කළේය.

වෛද්‍ය ශිෂ්‍යයන් පස් දෙනෙකු ශ්‍රේෂ්ඨාධිකරණයට ගොනු කළ මූලික අයිතිවාසිකම් පෙත්සමක් විභාගයට ගැනීමෙන් අනතුරුව අධිකරණය විසින් ඔවුන්ට රජයේ රෝහලක සායනික පුහුණුව ලබා දීමට අවසර ලබා දී තිබුණි.

රජයේ රෝහලක සායනික පුහුණුව ලබා දීමට බස්නාහිර පළාත් හිටපු සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා සමඟ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය අවබෝධතා ගිවිසුමක් අත්සන් කළ අතර එයට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විරෝධය පළ කළ බව හෙතෙම මෙහිදී අවධාරණය කළේය.

ඇතැම් පාර්ශ්වයන් මාලඹේ වෛද්‍ය විද්‍යාලයේ සිසුන්ට එරෙහිව ඇතැම් අසත්‍ය චෝදනා පතුරු වන්නේ ඊර්ෂ්‍යාවට බවද හෙතෙම සඳහන් කළේය.

මාලඹේ වෛද්‍ය විද්‍යාලයේ සුදුසුකම් නොමැති ශිෂ්‍යයන් සිටින බවට වෛද්‍ය විද්‍යාලවල සිසුන් ප්‍රකාශ කළද රජයේ වෛද්‍ය විද්‍යාලවල සුදුසුකම් නොමැති දහස් ගණනක් සිසුන් අධ්‍යාපනය ලබන බවත් ඒ ගැන කිසිවෙක් සඳහන් නොකරන බවත් මෙහිදී අවධාරණය කෙරුණි.

විදේශීය වෛද්‍ය උපාධිය ලබා මෙරටට පැමිණෙන වෛද්‍ය සිසුන්ට රජයේ රෝහල්වල සායනික පුහුණුව ලබා දීමට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා නීත්‍යානුකූලව අවසර ලබා දී තිබෙන අතර මාලඹේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ අධ්‍යාපනය ලබන සිසුන්ට රජයේ රෝහලක සායනික පුහුණුව ලබා දීමට වෛද්‍යවරුන්ගේ සංගමය විරුද්ධ වන්නේ මන්ද යන්න පිළිබඳව ගැටලුවක් බවද මෙහිදී ප්‍රකාශ විය.

විශ්වවිද්‍යාල සිසසිසුන්ට නායකත්ව පුහුණුව වෙනුවට විනය පුහුණුවක් ලබා දීමට කටයුතු කරන ලෙස උසස් අධ්‍යාපන ඇමතිවරයාගෙන් තමන් දෙමව්පිය සංසදය වෙනුවෙන් ඉල්ලීමක් කරන බවද රත්නායක මහතා මෙහිදී පැවසීය.

මාලඹේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ කටයුතු වලට එරෙහිව කටයුතු කරනුයේ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය, පෙරටුගාමී පක්ෂය හා අන්තර් විශ්වවිද්‍යාල බල මණ්ඩලයට අයත් සාමාජිකයින් බවද හෙතෙම පැවසීය.